වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

Annual Report

2018

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

தேசிய தொழில்முயற்சி அபிவிருத்தி அதிகாரசபை

National Enterprise Development Authority

කර්මාන්ත කටයුතු අමාත්‍යාංශය

கைத்தொழில் அமைச்சு

Ministry of Industry

හැඳින්වීම

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය 2016 අංක 07 දරන පාර්ලිමේන්තු පනත යටතේ 2006 වර්ශයේදී පිහිටුවන ලදී. ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් හට පහසුකම් සැපයීමට මෙම ආයතනය වෙත බලය පැවරී ඇත. දේශීය ව්‍යවසායකයන් හට යටිතල පහසුකම් මූල්‍ය හා ප්‍රතිපත්ති මට්ටමේ සහයෝගය ලබා දීම සඳහා අධිකාරී පනතේ නීති මගින් බලය පවරා ඇත.

රේඛීය අමාත්‍යාංශයේ උපදෙස් හා මග පෙන්වීම අනුව කළාපීය මට්ටමේ මෙන්ම ජාතික මට්ටමේ විවිධ ක්‍රියාකාරකම් සඳහා අධිකාරිය සම්බන්ධ වී ඇත. ආයෝජන ප්‍රවර්ධනය හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ යටතේ 2006 වර්ශයේ සිට 2010 වර්ශය දක්වා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය ලැයිස්තුගත වී තිබුනි. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය 2010 වර්ශය සිට කර්මාන්ත හා වාණිජ්‍ය කටයුතු අමාත්‍යාංශය යටතට පත්වී මේ දක්වා කර්මාන්ත හා වාණිජ්‍ය කටයුතු අමාත්‍යාංශය යටතේ පාලනය වේ.

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් හට ප්‍රාදේශිය ලේඛම් කොට්ඨාශ මට්ටමෙන් විවිධ වැඩසටහන් ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් ආරම්භ කරන්නට යෙදුණි. එ ය රාජ්‍ය හා පුද්ගලික බැංකු, ව්‍යාපාරික මන් ඩල, රාජ්‍ය නොවන සංවිධාන (දේශීය හා විදේශීය) ආදී රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන හා සම්බන්ධ වී ඇත. මෙම වැඩසටහන් වල පරමාර්ථය වී ඇත්තේ බිම් මට්ටමේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් හට මූල්‍ය සහයෝගීතාවය, පුහුණු හා උපදේශක සහයෝගීතාවය වැනි මූලික අවශ්‍යතාවයන් සැපයීම වේ. ප්‍රාදේශිය ලේඛම් කාර් යාල මට්ටමෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සම් බන් ධීකරණය සඳහා ප්‍රාදේශිය මට්ටමේ නිලධාරීන් ප්‍රාදේශිය ලේඛම් කාර් යාල වලට අනුයුක්ත කර ඇත.



දැක්ම

“ජාතියේ ආර්ථික, දේශපාලනික හා සමාජ අභිලාෂයන් සපුරාලීමෙහි ලා දායකත්වය සැපයිය හැකි තරඟකාරී ව්‍යවසායකත්ව ක්ෂේත්‍රයක් ශක්තිමත් හා තිරසාර අන්දමින් ගොඩනැංවීම”

මෙහෙවර

“**ශ්‍රී ලංකා ජාතික ආර්ථිකයේ ප්‍රමුඛ අංගයක් වශයෙන් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය** (NEDA) *යටතේ ඇති* **ව්‍යවසායන්හි සංවර්ධනය, පැවැත්ම හා තරඟකාරීත්වය නැංවීම උදෙසා පහසුකම් සැපයීම හා සක්‍රිය අන්දමින් සහාය දැක්වීම**”

අරමුණු

- ✓ ශ්‍රී ලංකාව තුළ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව සංවර්ධනය දිරිගැන්වීම, ප්‍රවර්ධනය සහ පහසුකම් සැපයීම මගින් ශ්‍රී ලංකා ආර්ථිකයේ වර්ධනය, ව්‍යාප්තිය හා සංවර්ධනය වේගවත් කිරීමට දිරි දීම.
- ✓ ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරි **(NEDA)** පනතේ පරමාර්ථයන් ඉටුකිරීමෙහි ලා විදේශීය වෙළඳපොළ අවශ්‍යතා සැපිරිය හැකි දේශීය ව්‍යාපාර ශ්‍රී ලංකාවෙන් බැහැරව අන්තර්ජාතික මට්ටමින් ස්ථාපිත කොට පවත්වාගෙන යාමට හැකි පරිදි සැලසුම් කිරීමට පෙළැඹවීම හා ඒ සඳහා දිරිගැන්වීම.
- ✓ කර්මාන්ත හා කෘෂිකාර්මික ක්ෂේත්‍රයන්හි වෙළඳ හා සංවර්ධන කටයුතු ඵලදායී අන්දමින් ප්‍රවර්ධනය කිරීමට සහ සහාය වීමට අවශ්‍ය වන්නා වූ ප්‍රතිපත්ති, සැළසුම් සහ සැළසුම්ගත ප්‍රවර්ධන දිරිදීමනා සම්පාදනය කිරීම.
- ✓ ව්‍යවසාය සංවර්ධනයේ ප්‍රමුඛ අවශ්‍යතාවයක් වශයෙන් තාක්ෂණික කුසලතා පරිපූර්ණ මානව ප්‍රාග්ධනයක් වශයෙන් ජනතාව සවිබල ගැන්වීම.
- ✓ සංවර්ධන අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
- ✓ ව්‍යවසාය සංවර්ධනයට සහ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය දායකත්වයට ප්‍රවේශය සඳහා ව්‍යවසායකයින්ට පහසුකම් සැපයීම.
- ✓ නිශ්පාදන සංවර්ධනය, තාක්ෂණික වැඩිදියුණු කිරීම් සහ පේටන්ට් බලපත්‍ර වාණිජකරණය සම්බන්ධයෙන් වන පර්යේෂණ හා සංවර්ධනය ඉහල නැංවීම සඳහා තාක්ෂණ සංවර්ධන අරමුදලක් පිහිටුවීම.
- ✓ ප්‍රාදේශීය ආර්ථික සංවර්ධනයට පහසුකම් සැලසීම.

අධ්‍යක්ෂක මණ්ඩලය

1. ඩී.කේ. බෝගොල්ලාගම මයා (සභාපති)
2. එස්. බාලසුබ්‍රමනියම් මයා (අතිරේක ලේකම්, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය)
3. එච්. ඒ. ටී. එරන්දි මිය (සහකාර අධ්‍යක්ෂ, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව, මහාභාණ්ඩාගාරය)
4. මංජුල සමරවික්‍රම මයා
5. එම්.එස්.එම් නදීර් මයා
6. හිමාලි ජිනදාස මිය
7. එම්.එෆ්.එස්.ඩබ්ලිව්. ස්ටෙම්බෝ මයා
8. සෙයිනුදීන් මරික්කාර් ඉෆාම් මයා
9. නයිනා මොහමඩ් සරූර් මයා

2023.03.10

ගරු පාර්ලිමේන්තු රමේෂ් පතිරණ මහතා

කර්මාන්ත කටයුතු අමාත්‍ය

කර්මාන්ත කටයුතු අමාත්‍යාංශය

අංක 73/1,

ගාලු පාර

කොළඹ 03

ගරු අමාත්‍යතුමනී,

වාර්ෂික වාර්තාව 2018

1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) වහන්තිය ප්‍රාකාර පහත සඳහන් ලියවිලි මේ සමග ඉදිරිපත් කරමි.

1. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ 2018 වර්ශය සඳහා වූ ප්‍රගති වාර්තාව
2. 2018 දෙසැම් බර් 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය, ආදායම් පිළිබඳ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය
3. **විගණකාධිපති වාර්ථාව**

ඔබේ අවංක,

ලසන්ත කාරියප්පෙරුම

සභාපති / අධ්‍යක්ෂ ජනරාල්

සංවර්ධන වැඩසටහන් - 2018

1.0 ව්‍යාපාර සංවර්ධන සේවා සැපයුම් ආයතන නාමාවලිය සකස්කිරීම

2.0 ව්‍යාපාර සංවර්ධන සේවා සැපයුම්කරුවන්ගේ ධාරිතා සංවර්ධනය

3.0 ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සම්මාන ප්‍රදානෝත්සව

4.0 දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංසද

5.0 පර්ෂද සංවර්ධන වැඩසටහන

6.0 ව්‍යාපාර වෙළඳ ප්‍රදර්ශන

7.0 ඇසුරුම්කරණ සහාය අවශ්‍ය ප්‍රාදේශීය ව්‍යවසායකයින් සඳහා පහසුකම් සැපයීම

8.0 ජාත්‍යන්තර ව්‍යාපාර නියෝජනය

9.0 ගැනුම් විකුනුම් හමුව

10.0 ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන්

11.0 විකාශන හා තාක්ෂණ හුවමාරු මධ්‍යස්ථානය (ITTC) ස්ථාපිත කිරීම -මාකඳුර

12.0 ‘‘උපාධිධාරී ව්‍යවසායක උදානය’’ වැඩසටහන

13.0 ආධාරක දැනුම ලබාදීම තුළින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් නගා සිටුවීම

14.0 ව්‍යවසායකත්ව සංවර්ධනය තුළින් ශ්‍රී ලාංකික තරුණ ප්‍රජාව ශක්තිමත් කිරීම

15.0 ව්‍යවසාය කළමනාකරණ පද්ධතිය - EMS

16.0 යුනෙස්කෝ සංවිධානයේ 7වන ආසියා පැසිපික් කළාපීය ව්‍යවසායකත්ව අධ්‍යාපන සමුළුව (UNESCO APEID)

17.0 එක්සත් ජාතින්ගේ සංවර්ධන වැඩසටහන (UNDP)

18.0 ඔබ මෙහෙයවන්න ව්‍යාපෘතිය

19.0 එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (UNDP) සමාජ ව්‍යවසාය සංවර්ධන වැඩසටහන

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ සංවර්ධන වැඩසටහන් - 2018

වැඩසටහන් අංක 01: ව්‍යාපාර සංවර්ධන සේවා සපයන ආයතන පිළිබඳ නාමාවලිය (BDS Directory) සකස් කිරීම.

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට මෙන්ම ව්‍යාපාර සංවර්ධන සේවා සපයන ආයතන වෙනුවෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අත්පොත ප්‍රකාශයට පත්කිරීමට සැළසුම් කර ඇත. එහි ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි, ව්‍යාපාර සංවර්ධන සේවා සපයන ආයතනවල තොරතුරු ඇතුලත් වන අතර, සාර්ථක ව්‍යාපාරයක් ආරම්භ කිරීමෙහිලා එය ඔවුන්ට ඉතා ප්‍රයෝජනවත් ලේඛනයක් වේ. (පිටු 200ක පමණ) ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ සංවර්ධන නිලධාරීන් මගින් හා පුවත් පත් දැන්වීම් මගින් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය තොරතුරු එක්රැස් කර ගන්නා ලදි. 2019 වර්ෂයේදී එය ප්‍රකාශයට පත්කිරීමට සැළසුම් කර ඇත.

වැඩසටහන් අංක 02: ව්‍යාපාර සංවර්ධන සේවා සපයන ආයතන සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන

ව්‍යාපාර සහාය සේවා, උසස් තත්ත්වයේ පාරිභෝගික සේවා උපදෙස්, මග පෙන්වීම, සහාය වීම සහ පුහුනුව ලබාදීම යනාදී සේවාවන් සැපයීම හරහා දේශීය ප්‍රජාව සමග කටයුතු කළයුතු අතර, එහිදී රැකියා විරහිත පිරිස් සඳහා පමණක් නොව ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාවසායක ප්‍රජාව වෙනුවෙන්ද එම සේවාවන් සැපයිය යුතුවේ. මෙකී සේවාවන්, තනි පුද්ගල උපදේශක සේවා මෙන්ම ව්‍යාපාර සංවර්ධන සේවා ආයතන(BDS) මගින්ද සපයනු ලැබේ. ව්‍යවසායකයින්ට සිය ව්‍යාපාර ආරම්භය, පුළුල් කිරීම, අපනයනය, මූල්‍ය පහසුකම්, අධ්‍යාපනය හෝ පුහුනු මෙන්ම අනෙකුත් ව්‍යාපාර සහාය සේවා සම්බන්ධයෙන් සහයෝගය අවශ්‍ය වේ. එනමුත්, ව්‍යවසායකයින් සඳහා එවැනි සේවාවන් සැපයීමේ විධිමත් යාන්ත්‍රණයක් නොමැත. එබැවින් ව්‍යාපාර සේවා සපයන ආයතනවල ධාරිතාවයන් ශක්තිමත් කිරීමට ව්‍යවසාය සංවර්ධන අධිකාරිය සැළසුම් කර ඇත. ව්‍යාපාර සංවර්ධන සේවා සපයන ආයතනවල ධාරිතා වර්ධනය සහ විධිමත් ව්‍යාපාර සංවර්ධන සේවා ජාලයක් ගොඩනැගීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි.



ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් ව්‍යාපාර සංවර්ධන සේවා ආයතනවල අවශ්‍යතා පිළිබඳ ඇගයීමක් සිදුකරන ලද අතර, එකී ආයතනවල නිලධාරීන් 25 දෙනෙකු පුහුනු කිරීමට කටයුතු කරන ලදි.

වැඩසටහන් අංක 03: ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සම්මාන ප්‍රදානෝත්සව

ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට ප්‍රශස්ත අන්දමින් දායකත්වය සපයා ඇති ව්‍යාපාර හඳුනා ගැනීම, ඇගයීම හා දිරිමත් කිරීමේ අරමුණෙන් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් ව්‍යවසායකත්ව සම්මාන ප්‍රදානෝත්සව පවත්වනු ලබයි. දිස්ත්‍රික් කාර්යාල / රාජ්‍ය ආයතනවල සහයෝගීතාවයෙන් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පළාත් නමය තුළ සම්මාන ප්‍රදානෝත්සව නමයක් පැවැත්වීමට කටයුතු සැළසුම්කොට ඇත. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය සහයෝගිතා ආයතන සමග සේවා ගිවිසුම් අත්සන් කොට ඇති අතර, 2018 වර්ෂයේදී සම්මාන ප්‍රදානෝත්සව අටක් පවත්වන ලදි.





මහනුවර සහ අම්පාර ව්‍යවසායකත්ව සම්මාන ප්‍රදානෝත්සව

වැඩසටහන් අංක 04: දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංසද

දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස (ප්‍රා/ලේ) මට්ටමින් ව්‍යවසායකයින්ට ව්‍යාපාර සංවර්ධන සේවාවන් සැපයීමේ විධිමත් යාන්ත්‍රණයක් ගොඩනැගීමේ අරමුණෙන් දිස්ත්‍රික්/ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංසද ස්ථාපිත කෙරේ. මෙකී සංසද දිස්ත්‍රික්කයේ රාජ්‍ය හා රාජ්‍ය නොවන ව්‍යාපාර සංවර්ධන සේවා සපයන ආයතන, වාණිජ මණ්ඩල සහ වෙළඳ හෝ ව්‍යාපාර සංගම් යනාදියෙන් සමන්විත වේ. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංසද පිහිටුවීමට සැලසුම්කොට ඇත. 2018 වර්ෂය දක්වා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් **දිස්ත්‍රික් ව්‍යවසායකත්ව සංසද** (DEF) 14ක් **හා ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංසද** (REF) 232ක් ස්ථාපිත කොට ඇත. තවද, ප්‍රාදේශීය මට්ටමින් ව්‍යාපාර ගැටලු විසඳීමේ විධිමත් යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම උදෙසා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය ගැටලු සෙවුම් මෘදුකාංගය නව්‍යකරණයට ලක්කරන ලදි.





මාතර දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ව්‍යවසායකත්ව සංසදය

වැඩසටහන් අංක 05: පර්ෂද සංවර්ධන වැඩසටහන

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය ව්‍යාපාර පර්ෂද සංවර්ධන වැඩසටහනට සම්බන්ධව සිටී. අළෙවි සංවර්ධන, ව්‍යවසායකත්ව සංවර්ධන, තාක්ෂණික හුවමාරුව සහ මූල්‍ය සහයෝගීතාවය යනාදී ක්ෂේත්‍රයන්හි සිය හැකියාවන් වර්ධනය කරගැනීමෙහිලා ව්‍යවසායකයින්ට සහාය වීමට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය අපේක්ෂා කරයි. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය සෑම පළාතකම ව්‍යාපාර පර්ෂද සංවර්ධන වැඩසටහන් පවත්වන ලදි (ප්‍රතිලාභීන් 315).





මාතලේ සහ කුරුණෑගල පර්ෂද සංවර්ධන වැඩසටහන්

වැඩසටහන් අංක 06: ව්‍යාපාර වෙළඳ ප්‍රදර්ශන

ව්‍යාපාර වෙළඳ ප්‍රදර්ශන පැවැත්වීමේ යෝජනාව තුළින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව ක්ෂේත්‍රය ප්‍රාදේශීය මට්ටමින් සංවර්ධනය කිරීම අපේක්ෂා කෙරේ. බොහොමයක් මධ්‍ය, සුලු හා ක්ෂුද්‍ර පරිමාණ ව්‍යවසායකයින් ප්‍රාදේශීය මට්ටමින් හා දිවයිනේ සෙසු ප්‍රදේශවල ඇති ව්‍යාපාර සංවර්ධන සේවා සපයන ආයතන හා එකී ආයතනවල ක්‍රියාකාරීත්වය හා සපයන සේවාවන් පිළිබඳව අවබෝධයක් නොමැති

බවත්, ඒ තුළින් එකී ආයතන මගින් උපරිම සේවාවක් ලබාගැනීමට නොහැකිව ඇති බවත්, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් හඳුනා ගන්නා ලදි. එබැවින්, ව්‍යවසායකයින් හා ව්‍යාපාර සංවර්ධන සේවා සපයන ආයතන අතර පවතින පරතරය අවම කිරීම උදෙසා ශක්තිමත් සම්බන්ධතාවන් හා අන්තර් ක්‍රියාකාරීත්වයක් ගොඩනැගිය යුතුව ඇත. මෙම ව්‍යාපාරික සේවා වෙළඳ ප්‍රදර්ශන මගින් ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන්ගේ සේවාවන් උපරිම ආකාරයෙන් භාවිතා කිරීමට හැකිවන ආකාරයෙන් සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් හා ව්‍යාපාර සංවර්ධන සේවා සපයන ආයතන අතර ඇති පරතරය අවම කෙරෙන අතර, එතුළින් ශක්‍යතාවයක් සහිත ව්‍යවසායකයින්ගේ ව්‍යවසායකත්වයන් තවදුරටත් ශක්තිමත් කෙරෙනු ඇත. තව ද, ඔවුන්ගේ නිශ්පාදන හඳුන්වා දීමට හා වෙළඳපොළ සබඳතා ගොඩනගාගැනීමට ද, මෙය ඉතා හොඳ අවස්ථාවක් වනු ඇත. 2018 දී, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් සෑම පළාතකම ව්‍යාපාරික සේවා වෙළඳ ප්‍රදර්ශන පවත්වන ලදි.





ගම්පහ දිස්ත්‍රික්කයේ ව්‍යාපාරික වෙළඳ ප්‍රදර්ශනය

වැඩසටහන් අංක 07: ඇසුරුම්කරණ සහාය අවශ්‍ය ප්‍රාදේශීය ව්‍යවසායකයින් සඳහා පහසුකම් සැපයීම

ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට සැපයුම්කරුවන් වශයෙන් ස්ථාවර වීමේ පහසුකම් සලසමින් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය ඔවුන් සැපයුම් කරුවන් වශයෙන් සුපිරි වෙළඳසැල් ජාලයට හඳුන්වා දෙනු ලබයි. ඒ අනුව, සංවර්ධන නිලධාරීන් හරහා හැකියාවන් සහිත සැපයුම්කරුවන් හඳුනාගැනීමට හා ඔවුන්ගේ නිශ්පාදනවල ගුණාත්මකභාවය හා ධාරිතාවයන් තක්සේරු කිරීමට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය කටයුතු කරනු ලැබේ. තව ද, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය තාක්ෂණික පුහුනුව ලබාදෙමින් ඔවුන්ගේ නිශ්පාදනවල ගුණාත්මකභාවය ඉහල නැංවීමට සහාය දක්වයි. 2018 දී ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මාතර හා කෑගල්ල දිස්ත්‍රික්කවල ව්‍යවසායකයින් 90 දෙනෙකු සඳහා තාක්ෂණික සහාය ලබාදෙන ලදි.





ඇසුරුම්කරණ පුහුණුව - කෑගල්ල දිස්ත්‍රික්කය

වැඩසටහන් අංක 08: අන්තර්ජාතික ව්‍යාපාර නියෝජනය

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ 2018 ක්‍රියාකාරී සැළැස්මට අනුව විදේශීය වෙළඳ ප්‍රදර්ශන සඳහා ව්‍යාපාරික නියෝජිතයින් සංවිධානය කිරීම හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට ඔවුන්ගේ ව්‍යාපාර ජාත්‍යන්තර තලයට ගෙන ඒම සඳහා පහසුකම් සැපයීම යනාදිය ඇතුලත් වේ. ඒ අනුව ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය තායිලන්තයේ අපනයන නිපැයුම් ප්‍රදර්ශනය සඳහා ව්‍යාපාරික නියෝජිත කණ්ඩායමක් (නියෝජිතයින් 15 දෙනෙකු) සහභාගී කරවන ලදි.

වැඩසටහන් අංක 09: ගැනුම් විකුනුම් හමු පැවැත්වීම

තිරසාර හා සමාන වූ ආර්ථික වර්ධනයකට ඵලදායී අන්දමින් දායකවීම උදෙසා ව්‍යවසායකයින් තුළ පවත්නා ශක්තීන් (ධාරිතාවයන්) සීමා කිරීමට අඛණ්ඩව බලපවත්නා සාධක කිහිපයකි. මෙවැනි සාධක බොහොමයක් හඳුනාගෙන ඇති අතර, ව්‍යවසායකත්ව දැනුම හා කුසලතා අඩුකම, ප්‍රාග්ධන හා යටිතල පහසුකම් අවම වීම, වෙළඳපොළ අවස්ථා සීමිත වීම හා ප්‍රමාණවත් තාක්ෂණික දැනුම නොමැතිකම යනාදිය ඒ අතර වේ. එකී සාධක කේන්ද්‍රකර ගනිමින් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය සේවාවන් සපයනු ලබයි.



ගම්පහ දිස්ත්‍රික්කයේ ගැනුම් විකුණුම් හමුව

වැඩසටහන් අංක 10: ප්‍රාදේශීය ව්‍යවසාය සංවර්ධන වැඩසටහන්

ශ්‍රී ලංකා ආර්ථිකයේ ප්‍රධාන භූමිකාවක් ප්‍රාදේශීය මට්ටමේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් විසින් ඉටුකරනු ලැබේ. එසේ වුව ද, ඔවුන්ට ව්‍යවසායකත්වය, අළෙවිකරණය, තාක්ෂණික හා මූල්‍ය කළමනාකරණය යනාදී ක්ෂේත්‍ර සම්බන්ධයෙන් පවතින දැනුම ප්‍රමාණවත් මට්ටමක නොමැති බව ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් හඳුනා ගන්නා ලදි. තව ද, ඔවුන් සිය ව්‍යාපාර ආරම්භ කිරීමට /පුළුල් කිරීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබා ගැනීමේ දුෂ්කරතාවයන්ට මුහුණ පා ඇත. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ සංවර්ධන නිලධාරීන් ප්‍රාදේශීය මට්ටමින් සේවයේ නියුක්තව සිටින අතර, ඔවුන් විසින් ඉහත කී දැනුම හා කුසලතා වර්ධනය කරලීමට අවශ්‍ය ව්‍යවසායකයින් හඳුනාගනු ලැබේ.

එබැවින් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය සංවර්ධන නිලධාරීන්ගේ සහයෝගය ඇතිව සියලුම දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය මට්ටමේ ව්‍යවසායකයින් සඳහා කෙටි කාලීන පුහුනු වැඩසටහන් හා පසු විපරම් සේවා පවත්වනු ලැබේ.

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය නවක හා ක්ෂේත්‍රයේ රැඳී සිටිනා ව්‍යවසායකයින් 12100ක් සඳහා පුහුණු වැඩසටහන් පවත්වන ලදි.





කළුතර හා කුරුණෑගල දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය ව්‍යවසාය සංවර්ධන වැඩසටහන්

වැඩසටහන් අංක 11: මාකඳුර විකාශන හා තාක්ෂණ හුවමාරු මධ්‍යස්ථානය (ITTC) ස්ථාපිත කිරීම.

විකාශන හා තාක්ෂණික හුවමාරු මධ්‍යස්ථානය යනු වෘත්තීයමය තාක්ෂණික සහාය ලබාදීම මගින් නව නිපැයුමක් හෝ සේවාවක් ආරම්භ කිරීමේ මූලික ප්‍රාග්ධනය අඩු කොට දැරීමට සිදුවන අවදානම අවම කළහැකි මධ්‍යස්ථානයකි.

මෙම ව්‍යාපෘතියේ අරමුණ වනුයේ ප්‍රදේශයේ පවතින ක්ෂුද්‍ර මූල්‍ය හා කුඩා කර්මාන්ත සඳහා පහසුකම් සැපයීම හා විශ්වවිද්‍යාල අධ්‍යාපනය නිමකළ උපාධිධාරීන් ස්වඋත්සාහයෙන් නැගී සිටීමට හැකියාව ලබාගන්නා තෙක්, ඔවුන්ට නව ව්‍යාපාර ආරම්භනය සඳහා පහසුකම් සැපයීමයි.

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය **(WUSL)** සහ ඒ හා ආශ්‍රිත පර්යේෂණ ආයතන මගින් සිදුකරන පර්යේෂණ හා සංවර්ධන ආයතන මගින් සොයාගනු ලබන නව්‍ය ව්‍යාපාරික අදහස් (නව සොයාගැනීම්) අනුව නව ව්‍යාපාර ඇරඹීමට අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර වෙනුවෙන් සිදුකරන ආයෝජන සඳහා විකාශන හා තාක්ෂණික හුවමාරු මධ්‍යස්ථානය (ITTC) පහසුකම් සැපයෙනු ඇත.

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය හා වයඹ විශ්ව විද්‍යාලය, විකාශන හා තාක්ෂණික හුවමාරු මධ්‍යස්ථානයේ ස්ථාපනය, කළමනාකරණය හා මෙහෙයුම් සම්බන්ධයෙන් අවබෝධතා ගිවිසුමකට එළැඹෙන ලදි. විකාශන හා තාක්ෂණික හුවමාරු මධ්‍යස්ථානය සමාගම් ලියාපදිංචි කිරීමේ ආයතනයේ ලියාපදිංචි සමාගමක් වනු ඇති අතර, කළමනාකරණ මණ්ඩලයක් මගින් පාලනය වනු ඇත.

මේ වනවිට, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය අදාළ ගොඩනැගිල්ල ඉදිකිරීම හා යන්ත්‍ර සූත්‍ර සවිකිරීම යනාදී කටයුතු නිමකොට ඇති අතර, 2017 දෙසැම්බර් මස මධ්‍යස්ථානය විවෘත කරන ලදි. වර්තමානය වනවිට, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය ව්‍යාවසායකයින්ට හා උපාධිධාරීන්ට සේවාවන් සපයනු ලබයි.





ව්‍යවසායකයින් දැනුවත් කිරීමේ වැඩසටහන

වැඩසටහන් අංක 12: Uni- ව්‍යවසායකයින් **(උපාධිධාරී ව්‍යවසායක උදානය)**

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විශ්ව විද්‍යාල සමග එක්ව උපාධිධාරීන් ව්‍යාපාර ක්ෂේත්‍රයට සම්බන්ධ කිරීම සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පවත්වනු ලබයි. උපාධිධාරීන් ව්‍යාපාරික ක්ෂේත්‍රයට ආකර්ශනය කරලීමේ මෙම වැඩසටහන **"උපාධිධාරී ව්‍යවසායක උදානය"** යනුවෙන් නම්කොට ඇත. මෙම වැඩසටහනේ අරමුණ වනුයේ උපාධිධාරීන් ව්‍යාපාරික ක්ෂේත්‍රයට පිවිසීම ධෛර්යමත් කිරීම හා ඔවුන් සාර්ථක ව්‍යවසායකයින් බවට පත්කිරීමයි.

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය සබරගමුව, රජරට, ඌව වෙල්ලස්ස, කැලණිය, ජයවර්ධනපුර සහ යාපනය විශ්ව විද්‍යාලවල උපාධිධාරීන් 205 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන් පවත්වා ඇති අතර, උපාධිධාරීන් 13 දෙනෙකු සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබාදෙන ලදි.





පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පුහුනු වැඩසටහන

වැඩසටහන් අංක 13: ආධාරක දැනුම ලබාදීම තුළින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් නගා සිටුවීම

බහුතරයක් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් ව්‍යාපාරික නීති හා රෙගුලාසි පිළිබඳ මනා දැනුමකින් තොරය. එබැවින්, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය සංවර්ධන නිලධාරීන්ගේ සහාය ඇතිව දිස්ත්‍රික් මට්ටමේ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට තීරණය කරන ලදි. පළමු අදියර වශයෙන්, බදු හා බදු ක්‍රියාපටිපාටිය, කම්කරු නීති හා රෙගුලාසි සහ පාරිභෝගික කටයුතු අධිකාරියේ සේවාවන් පිළිබඳව ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකින් (MSMEs) දැනුවත් කිරීමේ එක් දින වැඩසටහන් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් සංවිධානය කරන ලදි. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, කම්කරු දෙපාර්තමේන්තුව හා පාරිභෝගික කටයුතු අධිකාරිය මගින් සම්පත්දායකයින් සපයන ලදි. මෙම වැඩසටහන දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා ක්‍රියාත්මක කෙරෙන

අතර, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ ඉලක්කය වනුයේ මේ යටතේ සෑම දිස්ත්‍රික්කයකින්ම ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 100ක් පුහුනු කිරීමයි.

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය ව්‍යාපාර නීති හා රෙගුලාසි පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්ෂේත්‍රයට සම්බන්ධ ආයතනවල සහයෝගයෙන් යුතුව පවත්වනු ලබන අතර, මේ වනවිට දිස්ත්‍රික්ක 14ක දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇත.



මහනුවර දිස්ත්‍රික්කයේ දැනුවත් කිරීමේ වැඩසටහන

වැඩසටහන් අංක 14: ව්‍යවසායකත්ව සංවර්ධනය තුළින් ශ්‍රී ලාංකික තරුණ ප්‍රජාව ශක්තිමත් කිරීම

ව්‍යවසායකත්ව කුසලතා දියුනු කිරීම, මූල්‍ය පහසුකම් ලබාදීම, නව තාක්ෂණය, ව්‍යාපාරික උපදේශන සේවා, අධීක්ෂණ සේවා, නව සැළසුම් යනාදිය සැපයීම තුළින් මෙම වැඩසටහන තරුණ ප්‍රජාවට (වෘත්තීය/තාක්ෂණික විද්‍යාලවල අවසන් වසරේ හෝ ඉගෙනුම අවසන් කරන ලද සිසුන් සහ තරුණ අත්කම් නිර්මාණ ව්‍යවවසායකයින්) සහාය ලබාදේ. එබැවින්, අන්තර්ජාතික වෙළඳපොළ අවස්ථා ජයගත හැකි මට්ටමින් ශ්‍රී ලාංකික තරුණ තරුණියන්ගේ ව්‍යවසායකයත්ව කුසලතා වර්ධනය කරමින් ජාතිය සංවර්ධනය කිරීමෙහිලා මෙම වැඩසටහන වැදගත්කමක් උසුලයි.

ඒ අනුව ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය තරුණ ප්‍රජාව සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් හා වෘත්තීය පුහුනුලාභීන් සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පවත්වනු ලබයි. 2018 වර්ෂයේදී තාක්ෂණික අධ්‍යාපන හා පුහුනු කටයුතු දෙපාර්තමේන්තුවේ සහයෝගයෙන් වැඩසටහන් ක්‍රියාත්මක කෙරෙන අතර, එකී වැඩසටහන් බස්නාහිර පළාත තුළින් ආරම්භ කෙරේ. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් මේ සඳහා තරුණ ප්‍රතිලාභීන් 100ක් තෝරාගන්නා ලද අතර, ඔවුන්ට ව්‍යවසායකත්ව සංවර්ධන පුහුනුව ලබාදෙන ලදි. ඔවුන්ට අවශ්‍ය යන්ත්‍රසූත්‍ර හා උපකරණ 2019 වර්ෂයේදී සැපයෙනු ඇත.



කළුතර දිස්ත්‍රික්කයේ දැනුවත් කිරීමේ වැඩසටහන

වැඩසටහන් අංක 15: ව්‍යවසාය කළමනාකරණ පද්ධතිය - EMS

ව්‍යවසාය කළමනාකරණ පද්ධතිය යනු, ව්‍යවසායන්ගේ දත්ත පදනමක් නිර්මාණය කිරීම සඳහා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ සංවර්ධන නිලධාරීන් විසින් නව ව්‍යවසායන් ලියාපදිංචි කිරීම හා යෙදවීමේ ආරම්භක අදියර වශයෙන් භාවිතා කරන ස්වයංක්‍රීය ඩිජිටල් පද්ධතියකි.

මෙමගින් පහසුවෙන් භාවිතා කළහැකි මූලික වැඩ ප්‍රවාහයක් සපයන අතර, ව්‍යවසාය හිමිකරුවන් සමග රැස්වීම් පැවැත්වීම හා පසු විපරම් සිදුකිරීම සඳහා ද එය භාවිතා කළහැකි වේ.

ව්‍යවසාය කළමනාකරණ පද්ධතිය යනු ජාතික ව්‍යවසාය සංවර්ධන ආයතනයේ නිලධාරීන්ට විශ්වාසයෙන් යුතුව සිය නිපැයුම් ව්‍යවසායයන්ට හඳුන්වා දියහැකි ව්‍යුහාත්මක සන්නිවේදන මාර්ගෝපදේශයක් වේ.

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියට සිය සේවාවන් ව්‍යවසායකයින් වෙත ලබාදීම සඳහා **ව්‍යවසාය කළමනාකරණ පද්ධතිය** මගින් වඩාත් කාර්යක්ෂම වේදිකාවක් නිර්මාණය කරනු ඇත.





අම්පාර සහ අනුරාධපුර දිස්ත්‍රික්කවල පුහුනු වැඩසටහන්

වැඩසටහන් අංක 16: යුනෙස්කෝ සංවිධානයේ 7වන ආසියා පැසිපික් කළාපීය ව්‍යවසායකත්ව අධ්‍යාපන සමුළුව (UNESCO APEID)

යුනෙස්කෝ සංවිධානයේ 7වන ආසියා පැසිපික් කළාපීය ව්‍යවසායකත්ව අධ්‍යාපන සමුළුව (UNESCO APEID) පවත්වන ලද්දේ සෑම වර්ෂයකම එම වැඩසටහන සංවිධානය කරනු ලබන යුනෙස්කෝ සංවිධානයේ සංවර්ධනය උදෙසා අධ්‍යාපන නවෝත්පාදන ආසියා-පැසිපික් වැඩසටහන් අංශය මගිනි.

2018 වර්ෂයේ දී යුනෙස්කෝ සංවිධානය මගින් පවත්වන ලද මෙම වැඩසටහනට අංගයක් ඉදිරිපත් කිරීමේ අවස්ථාව ශ්‍රී ලංකාවට ලැබුනු අතර, එම ඉදිරිපත් කිරීම "අනාගත ව්‍යවසායකයින් රැක ගැනීම උදෙසා බහුවිධ පාර්ශ්වකරුවන් අතර සබඳතා අභිප්‍රේරණය" යනුවෙන් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් 2018 ඔක්තෝබර් මස 9-11 දක්වා ශ්‍රී ලංකාවේ, ත්‍රිකුණාමලය Trinco Blu හි දී පවත්වන ලදි.



රටවල් 20කට අධික සංඛ්‍යාවක් නියෝජනය කරමින්, රාජ්‍ය අංශය, එක්සත් ජාතීන්ගේ නියෝජිත ආයතන, විශ්වවිද්‍යාල සහ පුද්ගලික අංශයේ නියෝජිතයින්ගෙන් සමන්විත වූ මෙම වැඩසටහන අන්තර්ජාතික මාධ්‍ය, යුනෙස්කෝ ශාඛා ජාලය සහ අනෙකුත් අන්තර් ජාතික පාර්ශ්වකාර ආයතන හරහා ලෝකය පුරා අන්තර් ජාලය මගින් විසුරුවා හරින ලදි.

වැඩසටහන් අංක 17: එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) -2018

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙහි මූල්‍ය ප්‍රතිපාදන යටතේ, ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ මගපෙන්වීම හා කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ මෙහෙයවීම යටතේ නිවාස සහ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සඳහා වඩා හොඳ මාර්ගෝපදේශ ගොඩනැගීමේ දළ සටහන කෙටුම්පත් කිරීම උදෙසා, හානිපූර්ණ ප්‍රතිපත්තිය කෙටුම්පත් කිරීමේ කාර්යයට සහභාගී වී ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය සිය දායකත්වය සපයන ලදි. ඒ අනුව 2018 වර්ෂයේදී පහත දැක්වෙන කාර්යයන් සම්පූර්ණ කරන ලදි.

01. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය තාක්ෂණික ක්‍රියාකාරී කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් කටයුතු කරන ලද අතර, පාර්ශ්වකාර ආයතන සමග එක්ව ප්‍රාදේශීය මට්ටමේ වැඩසටහන් 06ක් පවත්වන ලදි.
02. ප්‍රාදේශීය මට්ටමේ නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය කිරීම උදෙසා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශීය නිලධාරීන්ට පුහුනු කරුවන් පුහුනු කිරීමේ තෙදින නේවාසික වැඩසටහන් පවත්වන ලදි.

03. රත්නපුර, කළුතර, ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවල ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට ව්‍යාපාර අඛණ්ඩතා සැළසුම සම්බන්ධයෙන් ප්‍රාදේශීය වැඩමුළු 04ක් පවත්වා අවසන් කරන ලදි.





ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශීය නිලධාරීන් වෙනුවෙනු පැවැත් වූ පුහුනු කරුවන් පුහුනු කිරීමේ වැඩසටහන

වැඩසටහන් අංක 18: You Lead **(ඔබ මෙහෙයවන්න) ව්‍යාපෘතිය**

You Lead යනු IESE (www.iesc.org/youlead) ආයතනය මගින් ක්‍රියාත්මක කරන ලද වේගා ව්‍යාපෘතියකි. එහිදී ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය එම ආයතනය සමග ප්‍රධාන පාර්ශ්වකාර ආයතනය වශයෙන් කටයුතු කරන ලදි. එම ආයතනය යෝජනා හා අත්දැකීම් එක්රැස් කිරීම සඳහා රජයේ හා පෞද්ගලික අංශයේ සියලුම ව්‍යාපාරික සංවර්ධන සේවා සපයන ආයතනවල සහභාගීත්වයෙන් වැඩමුළු මාලාවක් පැවැත්වීය.

එම ව්‍යාපෘතියේ ප්‍රතිඵලයක් ලෙස, ශ්‍රී ලංකාවේ ඕනෑම ව්‍යාපාර සංවර්ධන සේවා සපයන ආයතනයකට භාවිතා කළහැකි පොදු ව්‍යවසාය සංවර්ධන මොඩියුලයක් අප විසින් සම්පාදනය කරන ලද අතර, එසේ සම්පාදිත මොඩියුල ඔවුන්ගේ වෙබ් අඩවියෙන් ලබාගත හැක.

You Lead **ව්‍යාපෘතියේ සහාය ඇතිව** ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් **මූල්‍ය** කළමනාකරණය සහ මූල්‍ය ආයතන සමඟ කටයුතු කරන්නේ කෙසේද යන්න පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් කළුතර දිස්ත්‍රික්කයේ සංවිධානය කරන ලදී.

උක්ත වැඩසටහන සඳහා කළුතර දිස්ත්‍රික්කයේ බැංකු ක්ෂේත්‍රයේ සේවයේ නියුතු නම් කරන ලද සියලුම නිලධාරීන් සහ ව්‍යවසායකයින් එකසිය හැටක් සහභාගී විය.



වැඩසටහන් අංක 19: එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ සමාජ ව්‍යවසාය සංවර්ධන වැඩසටහන

තෝරාගත් රජයේ නිලධාරීන් 300 දෙනෙකු ඉතා සාර්ථක අන්දමින් පුද්ගල ව්‍යවසායකයින් හා සමාජ ව්‍යාපාර මෙහෙයුම්කරුවන් වශයෙන් නිරාවරණය කරමින්, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් ඔවුන් වෙනුවෙන් ව්‍යවසායකත්ව කුසලතා සහ සමාජ ව්‍යවසාය සංවර්ධනය පිළිබඳ TOT (පුහුනු කරුවන් පුහුනු කිරීමේ) එක් දින වැඩසටහන් තුනක් කුරුණෑගල සහ මහනුවර දිස්ත්‍රික්කයන්හි දී පවත්වන ලදි.

සමාජ ව්‍යවසායන් ලෙස සංවර්ධනය කිරීම සඳහා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කෘෂිකාර්මික නොවන හා සැකසූ ආහාර කර්මාන්තයේ නියැලී සිටින ව්‍යවසායකයින් 300 දෙනෙකු සඳහා ක්ෂේත්‍ර වැඩමුළු පවත්වන ලදී.

ව්‍යාපෘතියේ ප්‍රධාන කොටස්කරුවන් සමඟ සහයෝගයෙන් සමාජ ව්‍යවසායන් වෙත ප්‍රවිශ්ට වීමේ විභවයක් සහිත ව්‍යවසායන් සංවර්ධනය කිරීම සඳහා ඒකාබද්ධ නිර්දේශිත වාර්තාවක් ඉදිරිපත් කරන ලදී.

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශනය

	සටහන්	2017 රු.	2016 රු.
වැඩසටහන් සඳහා ලද ප්‍රතිපාදන භාවිතය			
වර්ෂය සඳහා සක්‍රිය වෙන්කිරීම්	16	37,631,641	31,614,270
වැඩසටහන් සඳහා වියදම්	9	37,631,641	31,614,270
වාර්ෂික වැඩසටහන්වල අතිරික්තය/(හිඟය)		-	-
මෙහෙයුම්			
මහ භාණ්ඩාගාර පුනරාවර්තන වෙන්කිරීම්		19,609,491	19,202,159
රාජ්‍ය ප්‍රතිපාදන මගින් ක්‍රමක්ෂය සඳහා වෙන්කිරීම්	14	3,074,050	5,631,434
වෙනත් ආදායම්	7	28,287,093	18,548,872
ආදායම් එකතුව		**50,970,633**	**43,382,465**
පරිපාලන වියදම්	8	23,536,262	25,333,872
වෙනත් ව්‍යාපාති සඳහා වියදම්	9	62,026	44,000
වියදම් එකතුව		**23,598,288**	**25,377,872**
වාර්ෂික වැඩසටහන්වල අතිරික්තය		**27,372,346**	**18,004,593**

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන්	2017 රු.	2016 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	10	10,097,481	11,988,452
ජංගම වත්කම්			
ලැබීම්	11	322,395	-
තැන්පතු හා අත්තිකාරම්	12	115,835,183	30,890,400
පෙරගෙවුම් වියදම්	13	63,916	83,187
උත්සව අත්තිකාරම්		10,250	10,000
ආපදා ණය		2,039,356	
මුදල් හා මුදල් සමානතා		2,308,452	18,498,850
ජංගම වත්කම් එකතුව		**120,579,552**	**49,482,436**
සී/ස බී එක්ස්ප්‍රස් සමාගම		**46,432,687**	**18,387,668**
ඉතිරිකිරීමේ ගිණුම් - පාරිතෝෂික		**521,567**	**521,567**
වෙනත් ජංගම වත්කම් එකතුව		**46,954,254**	**18,909,235**
වත්කම් එකතුව		**117,631,289**	**80,380,125**
හිමිකම් සහ වගකීම්			
හිමිකම්			
සමුච්චිත අතිරික්තය		26,303,316	18,564,910
හිමිකම් එකතුව		**26,303,316**	**18,564,910**
ජංගම නොවන වගකීම්			
රාජ්‍ය ප්‍රතිපාදන වෙන්කිරීම්	14	7,334,163	9,225,134
විශ්‍රාම ප්‍රතිලාභ	15	890,419	521,567
ජංගම නොවන වගකීම් එකතුව		**8,224,582**	**9,746,701**
ජංගම වගකීම්			
වැඩසටහන් සඳහා වෙන්කිරීම්	16	139,358,986	34,650,594

උපචිත වියදම්	17	527,093	1,479,581
කොන්ත්‍රාත් වගකීම්	18		4,326,007
අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක වන ව්‍යාපෘතිය	19	17,313	11,612,332
M/s.GIZ	20	3,200,000	
ජංගම වගකීම් එකතුව		**143,103,392**	**52,068,514**
හිමිකම් හා වගකීම් එකතුව		**177,631,289**	**80,380,125**

පිටු අංක 05සිට 18 දක්වා වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයේ අනිවාර්ය අංගයකි

අධිකාරියෙහි මූල්‍ය ප්‍රකාශනයන් ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත සමඟ ඒකඟ වන බවට මම සහතික කරමි.

ගණකාධිකාරී

අත්සන් කලේ,

අනුෂ්ක ගුණසිංහ

සභාපති/ අධ්‍යක්ෂ ජනරාල්

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් කරන ලදී.

....

අසංක විජෙසුන්දර එ.හේමසිර පෙරේරා

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } විප්සි/ ශී /එන්ආයිඒ/ ඵල්ඩ් /2018 | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2022 ඔක්තෝබර්

සභාපති

ජාතික වාරිකාය සංවර්ධන අධිකාරිය

ජාතික වාරිකාය සංවර්ධන අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිගේ වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 අභිනතාර මතය

ජාතික වාරිකාය සංවර්ධන අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා ඇතැත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අගෝකුත් පැහැදිලි කිරීමේ කොටසකුරුවල සාරාංශයකින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රමව්‍යවස්ථාවේ 154(1) වැවස්ථාව යමින ය-යෝජිතව නියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මූල්‍ය වාර්තා ප්‍රමාදවීම හේතුවෙන් අධිකාරිය සම්බන්ධ ගණුදෙනු පිළිබඳ වාර්තාව 2020 ජූලි 24 දින භාෂාතුරයෙන් යුතුව පාර්ලිමේන්තුවේ සභාගත කර ඇත. ආණ්ඩුක්‍රම වැවස්ථාවේ 154 (6) වැවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවෙ සභාගත කරවූ ලැබේ.

මාගේ වාර්තාවේ අභිනතාර මතය සඳහා පදනම් කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එම මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සහය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 අභිනකර මතය සඳහා හේතුව

1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල නොවීම

ශ්‍රී.ලං.ගි.ප්‍ර. 16 - දේපල පිරියක හා උපකරණ

(අ) ප්‍රමිතයෙහි 51 වේදය ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය අඩු කරමින් සෑම මුදල් වර්ෂයක් අවසානයේදීම සමාලෝචනය කළ යුතු අතර, අපේක්ෂා තත්ත්වයන් ඉගෙන දී කළ ඇස්තමේන්තුවලින් වෙනස් වන්නේ නම් එම වෙනස්කම ප්‍රමිත අංක 8 ප්‍රකාරව ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනසක් ලෙස ගිණුම්ගත කළ යුතුය. කෙසේ වෙතත්, 2018 දෙසැම්බර් 31 දිනට ලියාහැඳ අගය රු.7,476,170 ක් වූ යන්ත්‍රෝපකරණ , මෝටර් රථ, කාර්යාල උපකරණ, ලිඛිතු හා සවිකිරීම්, පුස්තකාල පොත්, ගිණුම් මෘදුකාංග සහ පරිගණක හා පරිගණක උපාංග වල අවශේෂ වටිනාකම් සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය සමාලෝචනය කර නොතිබුණි.

(ආ) ප්‍රමිතයෙහි 79 (ආ) වේදය ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද එහෙත් තවමත් භාවිතයට ගනු ලබන දේපල පිරියක හා උපකරණ වල ධාරණ අගය මුල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කළ යුතු බවද, සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද එහෙත් තවමත් භාවිතයට ගනු ලබන මෝටර් රථ 03ක, කාර්යාල උපකරණ 22 ක සහ පරිගණක සහ උපාංග 37 ක ධාරණ අගය මුල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) අධිකාරියේ පරිපාලන සමාගමක් විසින් 2017 වර්ෂයේ නිකුත් කරන ලද කොටස් සහතිකය අනුව එම සමාගමේ ප්‍රකාශිත කොටස් 100න් කොටසක් රු. 10 බැගින් වූ කොටස් 60 ක් අධිකාරිය වෙත නිකුත් කර නිබුණද , එම කොටස් නිකුතුව සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ මුල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

(ආ) පෙරවැඩුම් සහ තාක්ෂණික නුවමාරු මධ්‍යස්ථානයක් ස්ථාපිත කරදීම සඳහා කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය විසින් රු. 46,450,000 ක ප්‍රාග්ධන ප්‍රදානයක් අධිකාරිය වෙත ලබා දී නිබුණි. එම මුදල් අධිකාරිය විසින් ආදායමක් වශයෙන් හඳුනාගෙන නිබූ අතර ඒ සඳහා කරන ලද වියදම් අධිකාරියේ ජංගම වත්කම් යටතේ පරිපාලන සමාගමේ ආයෝජනයක් වශයෙන් දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත

වර්ෂයේ සමුච්චිත අතිරික්තය සහ ජංගම වත්කම් රු. 46,450,000 කින් මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

යමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය

හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මුල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම්, වැදගත්කම සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, මාගේ වාර්තාවේ අනිවාර්ය මාතෘකා සඳහා පදනම් කොටගෙන විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් නැත, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (අ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (I) (අ) (IV) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිරීක්ෂණයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2. අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම හේතු, පහත සඳහන් ප්‍රකාශ කිරීමට හරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් ගාම්භීරයෙකුට අධිකාරිය සම්බන්ධව යම් ඕවිලුම්ක් සම්බන්ධයෙන් සාපුව හෝ අනවසරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති රීති / විධානයට යොමුව	විස්තරය
(අ) 2006 අංක 12 දරන මුද්දර බදු පනත හා 2008 ජනවාරි 01 දිනැති අංක 1530/13 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය	වටිනාකම රු.25,000 ට වැඩි ගෙවීම් සඳහා රු.25 ක් වූ මුද්දර ගාස්තු අයකල යුතු වුවද අවස්ථා 10 කදී රු. 1,646,130 ක ගෙවීම් වලට අදාලව මුද්දර ගාස්තු අඩුකර ගෙන නොතිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මුදල් රෙගුලාසි 104 හා 105	සමාලෝචිත වර්ෂය තුල අවස්ථා 05 කදී අධිකාරියේ වාහනවලට අනතුරු සිදුවී තිබුණද ඒ සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ii) මුදල් රෙගුලාසි 395 (ඇ)	බැංකු ගිණුමක් ඇති සෑම ආයතනයක් විසින්ම එක් එක් මාසය අවසානයේ දී ඇති ගණුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊලඟ මාසයේ 15 වෙනි දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කළයුතු වුවත්, අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයට අදාල බැංකු සැසඳුම් ඒ අනුව පිළියෙල කර නොතිබුණි.
(iii) මුදල් රෙගුලාසි 507 හා 756	දෙසැම්බර් මස 31 දිනට භාණ්ඩ සමීක්ෂණයක් කර වාර්තාවක් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළයුතු වුවත්, 2017 හා 2018 වර්ෂ සඳහා භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණි.

2.2.3. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් 50 දෙනෙකුගේ ධාරිතා සංවර්ධනය සඳහා පුහුණුව ලබා දීමට රු. 500,000 ක් වෙන්කර තිබුණද ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් 27 දෙනෙකු පමණක් පුහුණු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට ප්‍රතිපාදන වලින් සියයට 26 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

(ආ) ව්‍යවසායකයින් 200 දෙනෙකු සඳහා ඇසුරුම්කරණ තාක්ෂණික පුහුණුව ලබාදීම සඳහා සමාලෝචිත වර්ෂයේ රු.850,000 ක් ඇස්තමේන්තු කර තිබුණද,මුදල් අමාත්‍යාංශයෙන් ප්‍රතිපාදන ලැබීම සීමාවීම හේතුකොටගෙන සමාලෝචිත වර්ෂය අවසන් වන විට මාතර හා කෑගල්ල දිස්ත්‍රික්කවල ව්‍යවසායකයින් 90 දෙනෙකු සඳහා පමණක් පුහුණුව ලබා දී තිබුණි.

(ඇ) උපාධිධාරී ව්‍යවසායක උදානය යටතේ උපාධිධාරීන් 150 දෙනෙකු පුහුණු කිරීමට හා 25 දෙනෙකු සඳහා මූල්‍ය පාධාර ලබාදීමට සැලසුම් කර රු.මිලියන 4.5 ක් ප්‍රතිපාදනය කර තිබුණද සමාලෝචිත වර්ෂය තුල උපාධිධාරීන් 13 දෙනෙකු සඳහා පමණක් රු.1,825,000 ක් මූල්‍යාධාර ලෙස ලබා දී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී ISO සහතිකය ලබාගැනීම සඳහා රු.200,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද අධිකාරියේ තත්ත්ව කළමණාකරණ පද්ධතිය සවිමත් කිරීම සඳහා උපදේශකයෙකුගේ සේවය ලබාගැනීම සඳහා පුවත්පත් දැන්වීමක් පමණක් පලකර තිබුණි. ISO සහතිකය ලබාගැනීම සඳහා 2016 වර්ෂයේ රු.71,262 ක් ද 2017 වර්ෂයේ රු.125,000 ක් ද සමාලෝචිත වර්ෂයේ රු.35,880 ක් ද වශයෙන් එකතුව රු.232,142 ක් වැයකර තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ISO සහතිකය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ආ) කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ සත්‍යාලෝකිත වර්ෂයට අදාළ ශ්‍රීයානාරී සැලැස්මෙහි අධිකාරිය මඟින් ක්‍රියාත්මක කිරීමට යෝජනා කරන ලද පරාණ වෘවසාය සංවර්ධනය සඳහා අමාත්‍යාංශය විසින් අධිකාරිය වෙත රු.මිලියන 5.7 ක් වෙන්කර නිබුණද සමාලෝකිත වර්ෂයේ අමාත්‍යාංශය විසින් එම වැඩසටහන සඳහා රු.මිලියන 1.14 ක් අත්තිකාරම් වශයෙන් ලබා දී තිබුණි. මෙම වැඩසටහන සඳහා එක් දිස්ත්‍රික්කයකින් වශයෙන් ප්‍රහුණුලාභීන් 25 දෙනෙකු බැගින් දිස්ත්‍රික් 09 කින් 225 දෙනෙකු ප්‍රහුණු කිරීමට හා 180 දෙනෙකු සඳහා රු.100,000 බැගින් වියාපාර ආරම්භ කිරීම සඳහා මූල්‍යාධාර ලබාදීමට සැලසුම් කර තිබුණි. සමාලෝකිත වර්ෂය තුල මෙම වැඩසටහන සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කල ප්‍රතුව පැවතුනද වර්ෂය අවසන් වන විට මස්තාණිර පලාතේ ප්‍රහිලාභීන් 100 දෙනෙකු හඳුනාගෙන වියාපාර සැලසුම් සැකසීමේ දින 02 ක ප්‍රහුණුවක් පමණක් ලබා තිබුණු අතර වැඩසටහන සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනයෙන් වර්ෂය අවසන් වන විට රු.678,914 ක් පමණක් වැයකර තිබුණි.

(ඇ) Know how වියාපාරික යටතේ එක් දිස්ත්‍රික්කයකින් ස්ත්‍රී, පුරු හා මධ්‍යම පරිමාණ වෘවසායකයින් 100 ක් ඉලක්ක කර ගෙණ පළමු අදියර යටතේ බිදුකරණය,බිදුකරණ ක්‍රියාවලිය,සමාකරු ශිල්පාධ්‍ය නීති හා විකි සහ පාරිභෝගික කටයුතු අධිකාරියේ ලේඛා සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට යෝජනා කර සමාලෝකිත වර්ෂය සඳහාවෙන් රු.මිලියන 7 ක් වෙන්කර තිබුණි. ඇස්තමේන්තු කරන ලද සම්පූර්ණ ප්‍රතිපාදන නොලැබීම මත දිස්ත්‍රික්ක 14 ක පමණක් මේ වැඩසටහන පවත්වා තිබුණු අතර ඉන් දිස්ත්‍රික්ක 06 කින් වෘවසායකයින් 373 ක් පමණක් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා තිබුණි.

(ඈ) කාර්යාල ඉඩකඩ කුලියට ලබාගැනීම සඳහා ප්‍රතිපාදන දැන්වීමක් පල කිරීම සඳහා 2017 වර්ෂයේ රු.49,507 ක් වැයකර තිබුණු අතර එම දැන්වීමට අදාළ ලංසු භාරගැනීමේ අවසාන දිනය දීර්ඝ කිරීම සඳහා තැවත රු.48,300 ක් වැයකර තිබුණි. කෙසේ වුවද, අමාත්‍යාංශ කාර්යාල ගොඩනැගිල්ලේම අදාළ කාර්යාලය පවත්වා ගැනීමට තීරණය වීම හේතුවෙන් ඒ සඳහා දරන ලද රු.97,807 ක වියදම අනාවර්තක වියදමක් වී තිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) 2006 අංක 17 දරන ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පනත අනුව අධිකාරියේ අරමුණු අතුරින් පහත දැක්වෙන ප්‍රධාන අරමුණු ඉටු කර ගැනීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි.

(i) පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා විදේශ වෙළෙඳපලවල් ජයග්‍රහණය කිරීමට හැකි දේශීය ව්‍යවසායන් ජාත්‍යන්තරකරණය කිරීමේ අරමුණින් ව්‍යවසායන් ශ්‍රී ලංකාවෙන් පිට පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම උනන්දු කරවීම සඳහා දිරි ගැන්වීම.

(ii) තාක්ෂණික දියුණුව , නිෂ්පාදන සංවර්ධනය සහ පේටන්ට් අයිතියේ වාණිජකරණයට අදාල පර්යේෂණ සහ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා තාක්ෂණික සංවර්ධන අරමුදලක් පිහිටුවීම.

(ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2022 අගෝස්තු 18 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි.

(ඇ) 2017 වර්ෂයේදී ව්‍යවසාය ප්‍රවර්ධන නිලධාරී තනතුරු 02 ක් සහ ව්‍යවසාය ප්‍රවර්ධන සහකාර තනතුරු 06 ක් සඳහා බඳවා ගැනීමට සහ 2018 වර්ෂයේදී ව්‍යවසාය ප්‍රවර්ධන නිලධාරී තනතුරු 02 ක් , ව්‍යවසාය ප්‍රවර්ධන සහකාර තනතුරු 08 ක් සහ සහකාර අධ්‍යක්ෂක තනතුරක් සඳහා බඳවා ගැනීමට ප්‍රවත්පත් දැන්වීම් පළකිරීම සඳහා පිළිවෙළින් රු.163,760ක් හා රු.315,962 ක් වැයකර තිබුණද එම තනතුරු සඳහා 2018 දෙසැම්බර් 31 දින වන විටත් බඳවා ගැනීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්. ඩී.සී. වික්‍රමරත්න
විගණකාධිපති